# ස්වාමීන් වහන්සේ ජේරුසලෙමට ඇතුලු වූ නියාව සැමරීම

## සුවිශේෂය මතෙව් 21: 1–11

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

සමිඳුන්ගේ නාමයෙන් වඩින මෙතුමෝ ආසිරි ලද්දෝය.

එකල්හි ඔව්හු ජේරුසලමට ළං ව ඔලීව කන්ද සමීපයෙහි වූ බෙත්පාගයට පැමිණියහ. ජේසුස් වහන්සේ ශ්‍රාවකයන් දෙදෙනෙකු යවමින්, “ඉදිරිපිට තිබෙන ගමට යන්න, ගිය කෙණෙහි ම එහි බැඳ සිටින කොටළු දෙනක හා ඈ සමග කොටළු නාම්බෙකු ඔබට සම්බ වනු ඇත. උන් ලිහා මා වෙතට ගෙනෙන්න. යම් කෙනෙකු යමක් කීවොත්, ‘සමිඳාණන් වහන්සේට උන්ගෙන් වැඩක් ඇතැ’යි කියන්න: එවිට ඔහු වහාම උන් එවනු ඇතැ”යි ඔවුන්ට වදාළ සේක. මෙසේ වූයේ දිවස්වරයා ලවා කියවන ලද මේ දෙය ඉටු වන පිණිස ය. එනම්:

“බලන්න, ඔබේ රජ කොටළුවෙකු පිට,
එසේ ය, කොටළු වස්සෙකු පිට නැගී,
යටහත් පහත් ලෙස ඔබ වෙත එන්නේ යයි
සියොන් වැසියන්ට දන්වන්න.” යනුයි.

‘ශ්‍රාවකයෝ ගොස් ජේසුස් වහන්සේ නියම කල ලෙස කළහ: කොටළු දෙන ද පැටියා ද ගෙනවුත් තමන්ගේ උතුරුසළු උන් පිට එළාලූහ. උන් වහන්සේ හිඳගත් සේක. සමූහයාගෙන් බොහෝ දෙනෙක් තමන්ගේ උතුරු සළු මග අතුලෝ ය: තවත් සමහරු ගස්වලින් අතුකපා මග අතුලෝ ය. පෙරටුව හා පසුව ගමන් කළ සමූහයෝ, “දාවිත් රජුගේ පුත්‍රයාණන්ට හෝසන්නා! සමිඳුන්ගේ නමින් වඩිනා මෙතුමාණන් හට, ආසිරි වේ වා! ඉතා උසස් තැන්හී හෝසන්නා!” කියා මොර ගැසූ හ.

උන් වහන්සේ ජෙරුසලමට පිවිසි කල, මුළු නුවර වැසියෝ කැළඹී, "මේ කවරෙක් දැ"යි ඇසූ හ. සමූහයෝ ද, "මෙතුමාණෝ ගලීලයේ නාසරෙත් නුවර දිවැසිවර ජේසුස් වහන්සේ ය"යි පිළිතුරු දුන්හ.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*

# දිව්‍ය පූජා කියැවීම්

## පළමුවන දේව ප්‍රකාශනය යෙසායා 50: 4–7

*යෙසායා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.*

### මගේ මුහුණ නින්දාවලින් ඉවත හරවා නොගතිමි.

විඩාවට පත්වූවන් ශක්තිමත් කරන පිණිස ගුරුවරයෙකු මෙන් මා කිව යුතු දේ ගැන සිසුවෙකු මෙන් එතුමන්ට සවන් දෙනු පිණිස මහෝත්තම දෙවිසමිඳාණෝ හැම උදයක ම මා තුළ උනන්දුවක් ඇති කරවන සේක. දෙවි සමිඳුන් මාගේ කන් පහදා ඇත. මා එතුමන්ට විරුද්ධ ව කැරලි ගැසුවේ වත්, එතුමන්ට පිටුපා ගියේ වත් නැත. මට පහර දෙන්නන්ට මම මාගේ පිට පෑවෙමි. මාගේ රැවුල් ගස් උදුරන්නන්ට මම මුහුණ දුන්නෙමි. මාගේ මුහුණ නින්දාවෙනුත්, කෙළ ගැසීමෙනුත් හරවා නොගතිමි. මහෝත්තම දෙවි සමිඳාණන් මට උපකාර කරන බැවින් මම වියවුල් නොවන්නෙමි. මම තිර්හිත ලෙස මුහුණ පාන්නෙමි. මා ලජ්ජාවට නොපැමිණෙන බව දනිමි.

*දේව වාක්‍යය එසේ ය.*

## පිළිතුරු ගීය

## ගීතාවලිය 22: 7–8, 16–19, 22–23

**පිළිතුර:** මාගේ දෙවියනි, මාගේ දෙවියනි, ඔබ මා අත්හැරියේ මන්ද?

**ගීය :** සියල්ලෝ මා දෙස බලා, කවටකම් කරති:
දත තියවා, හිස වනා මෙසේ කියති:
"සමිඳුන්ට ඔහු බාර විණි, එතුමන් ඔහු ගළවා නොගන්නේ මන් ද?
සමිඳුන්ට ඔහු ප්‍රිය මනාප විණි,
එතුමන් ඔහු මුදා නොගන්නේ මන් ද?"

මන්ද, නපුරු මිනිස්සු බලු රැළක් මෙන්
මා වට කර ගත්තෝ ය.
මැරවරයෝ රැළක් මා වටලා ගත්තෝ ය.
ඔව්හු මාගේ දැත් දෙපා සිදුරු කළෝ ය.
මාගේ ඇටකටු ගණින් කළ හැකි තරමට පෑදී ඇත.
සතුරෝ මා දෙස රවා ඔරවා බලති.

මාගේ වස්ත්‍ර තම තමන් අතර බෙදා ගනිති:
මාගේ සළුව ගැනීමට දාදු දමති.
හිමි තුමාණෙනි, මා හැර දමා ඈත් නොවනු මැනව:
මාගේ බලය වන ඔබ මට පිහිට වන්නට කඩිනම් වුව මැනව.

ඔබේ නාමය මාගේ සහෝදරයන්ට ප්‍රකාශ කරන්නෙමි:
බැතිමතුන්ගේ සභාවේ දී ඔබට ප්‍රශංසා කරන්නෙමි.
හිමි සමිඳාණන්ට ගරුබිය ඇත්තෙනි, එතුමන් පසසන්න:
ජාකොබ් වංශයේ සියල්ලෙනි, එතුමන්ට ගෞරවය දෙන්න:
ඉශ්රායෙල් වංශයේ සියල්ලෙනි,
එතුමන් ඉදිරියෙහි ගරු බියෙන් සිටින්න.

## දෙවන දේව ප්‍රකාශනය පිලිප්පි 2: 6–11

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් පිලිප්පිවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසක.*

ජේසුස් වහන්සේ යටහත් පහත් වූ හෙයින්
සියල්ලට වඩා උසස් කරනු ලැබූ සේක.

ජේසුස් වහන්සේ, දෙවියන් වහන්සේගේ ස්වරූපය දැරූ නමුත්, දෙවියන් වහන්සේ හා සමානත්වය තමන් විසින් බදාගෙන ම තබාගත යුතු වස්තුවකැයි නොසිතා, තමන් වහන්සේ ම ත්‍යාජ කරගනිමින්, වහලෙකුගේ ස්වරූපයක් ගෙන, අප හා සමාන මිනිස් කෙනෙක් වූ සේක. මනුෂ්‍යාකාරයෙන් සිටිමින්, උන් වහන්සේ, මරණය, එනම් කුරුසියේ මරණය දක්වා, පහත් වී කීකරු වූ සේක. එබැවින් දෙවියන් වහන්සේ උන් වහන්සේ අති උසස් තැනට නංවා, සියලු නාමයන්ට වඩා අග්‍ර නාමය උන් වහන්සේට දුන් සේක. එසේ කළේ, ස්වර්ගයෙහි ද පොළොවෙහි ද, පාතාල ලෝකයෙහි ද සියල්ලන්, 'ජේසුස්' යන නාමයට දණ නමන පිණිසත්, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සමිඳාණන් වහන්සේ යයි දෙව් පියාණන් වහන්සේගේ මහිමය සඳහා, සෑම දිවකින් ම ප්‍රකාශ කරන පිණිසත් ය.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද පිලිප්පි 2: 8–9

ක්‍රිස්තුස් වහන්සේ, මරණය,
එනම් කුරුසියේ මරණය දක්වා, පහත් වී කීකරු වූ සේක.
එබැවින් දෙවියන් වහන්සේ උන් වහන්සේ අති උසස් තැනට නංවා,
සියලු නාමයන්ට වඩා අග්‍ර නාමය
උන් වහන්සේට දුන් සේක.

## සුවිශේෂය මතෙව් 26: 14 – 27: 66

*සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියා තිබෙන සැටියට අප ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දුඃඛ ප්‍රාප්තිය මෙසේය.*

*(වරහන් අතර කොටස අත් හළ හැක.)*

(1. එකල්හි දොලොස් දෙනා ගෙන් කෙනෙකු වූ ජුදස් ඉස්කාරියොත්, නායක පූජකයන් වෙත ගොස්, මෙසේ ඇසුවේය.

2. ජේසුස් වහන්සේ ඔබට පාවා දුන්නොත් ඔබ මට දෙන්නේ කුමක් ද?

1. යි ඇසී ය. ඔව්හු රිදී කාසි තිහක් කිරා ඔහුට දුන්හ. එතැන් පටන් ඔහු උන් වහන්සේ පාවා දීමට සුදුසු අවස්ථාවක් සෙව් ය. නුමුහුන් රොටි මංගල්‍යයේ පළමු වන දින ශ්‍රාවකයෝ ජේසුස් වහන්සේ වෙතට අවුත්, මෙසේ ඇසුවෝය.

2. ඔබවහන්සේ පාස්කු භෝජනය වළඳන පිණිස අප කොතැන පිළියෙළ කරනවාට ඔබ කැමති සේක් ද?

1. ජේසුස් වහන්සේ ඔවුනට උත්තර දෙමින් මෙසේ වදාළ සේක.

✠ ඔබ නගරයේ සිටින අසවල් මනුෂ්‍යයා වෙතට ගොස්, ‘මාගේ නියමිත මොහොත ළං ව ඇත: මාගේ ශ්‍රාවකයන් සමඟ ඔබේ නිවසේ දී පාස්කු භෝජනය පවත්වමි යි ගුරු දේවයන් වහන්සේ පවසන සේකැ’යි ඔහුට දන්වන්න.

1. ශ්‍රාවකයෝ ජේසුස් වහන්සේ ඔවුන්ට අණ කළ ලෙස පාස්කු භෝජනය පිළියෙළ කළහ. සවස් වූ කල උන් වහන්සේ ප්‍රේරිතයන් දොලොස් දෙනා සමඟ කෑමට හිඳගත් සේක. ඔවුන් කෑම කමින් සිටිය දී, උන් වහන්සේ කතා කොට මෙසේ වදාළ සේක.

✠ සැබැවින් ම මම ඔබට කියමි, ඔබෙන් කෙනෙක් මා පාවා දෙන්නේ ය.

1. ඔව්හු අතිශයින් ශෝක ව එකිනෙකා, “ස්වාමීනි, ඒ මම දැ?”යි අසන්න පටන් ගත්හ. උන් වහන්සේ උත්තර දෙමින් මෙසේ වදාළ සේක.

✠ මා සමග එක පාත්‍රයේ අතලන තැනැත්තේ මා පාවා දෙන්නේ ය. මනුෂ්‍ය–පුත්‍රයාණන් ගැන ශුද්ධ ලියවිල්ලේ ලියා තිබෙන ලෙස ම ඔහු තියමිත ගමන යන්නේ ය. එහෙත්, මනුෂ්‍ය–පුත්‍රයාණන් පාවා දෙන යම් මනුෂ්‍යයෙක් වේ ද, ඔහුට වන විපතක මහත! ඒ මිනිසා නූපන්නේ නම් වඩා හොඳ ය.

1. උන් වහන්සේ පාවා දුන් ජුදස් උත්තර දෙමින්,

2. ගුරුදේවයෙනි, ඒ මම ද?

1. යි ඇසීය. උන් වහන්සේ පිළිතුරු දෙමින් මෙසේ වදාළ සේක.

✠ වෙන කවුද?.

1. ඔවුන් කෑම කමින් සිටිය දී ජේසුස් වහන්සේ රොටි ගෙන ආශිර්වාදය පවසා ඒවා කඩා ශ්‍රාවකයන්ට දී, මෙසේ වදාළ සේක.

✠ රැගෙන වළඳන්න, මේ මාගේ ශරීරය.

1. උන් වහන්සේ කුසලානක් ද ගෙන තුති පුදා ඔවුන්ට දී, මෙසේ වදාළ සේක.

✠ ඔබ සියල්ලෝ ම මෙයින් පානය කරන්න. මෙය පව් කමාව පිණිස බොහෝ දෙනා උදෙසා වගුරුවනු ලබන මාගේ ගිවිසුම් රුධිරය වේ. මාගේ පියාණන්ගේ රාජ්‍යයෙහි දී මා ඔබ සමග අලුත් මිදියුස පානය කරන දවස එන තුරු මෙතැන් පටන් මේ මිදියුස තවත් නොබොන්නෙමි යි ඔබට කියමි.

1. ඔව්හු ගීතයක් ගයා නිම කොටු ඔලීව කන්දට නික්ම ගියහ. තවද ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ට කතා කොට මෙසේ වදාළ සේක.

✠ ඔබ හැම දෙන ම අද රාත්‍රියෙහි මා නිසා අධෛර්යයට පත් වන්නහු ය. මන්ද, 'මම එඬේරාට පහර දෙන්නෙමි, එවිට රැළේ බැටළුවෝ විසුරුවනු ලබන්නෝ ය'යි ශුද්ධ ලියවිල්ලෙහි ලියා තිබේ. "එහෙත්, මම උත්ථාන කරනු ලැබූ පසු ඔබට පෙරටුව ගලීලයට යමි."

1. පේදුරු උන් වහන්සේට උත්තර දෙමින්, මෙසේ කීවේය.

2. ස්වාමීනි, අන් හැම දෙන ම ඔබ නිසා අධෛර්ය වුවත් මම නම් කවදාවත් අධෛර්ය නොවන්නෙමි.

1. ජේසුස් වහන්සේ ද ඔහුට උත්තර දෙමින් මෙසේ වදාළ සේක.

✠ සැබවින් ම මම ඔබට කියමි, අද රෑ කුකුළා අඬලන්නට පෙර ඔබ මා හඳුනන්නේ නැත කියා තුන් වරක් කියන්නෙහි ය.

1. එවිට පේදුරු මෙසේ කීය.

2. ඔබ සමඟ මැරෙන්න සිදුවුණත්, මම ඔබ නාඳුනමි යි කවදාවත් කියන්නේ නැත.

1. සියලු ශ්‍රාවකයෝ ද එසේ ම කී හ. එකල ජේසුස් වහන්සේ ඔවුන් හා සමඟ ගෙත්සෙමන නම් වූ තැනට පැමිණ, උන් වහන්සේ ඔවුනට මෙසේ සැළ කළාහ.

✠ මා එතැනට ගොස් යාච්ඤා කරන අතර ඔබ මෙහි සිටින්න.

1. උන් වහන්සේ පේදුරු ද සෙබදීගේ පුත්‍රයන් දෙදෙනා ද කැඳවාගෙන ගිය සේක. ඉන්පසු උන් වහන්සේ ශෝක වන්ටත්, සන්තාප වන්ටත් පටන්ගත් සේක. එකල උන් වහන්සේ ඔවුන් අමතමින් මෙසේ වදාළ සේක.

✠ මැරෙන තරමට මාගේ සිත අතිශයින් ශෝකාන්විත ය. ඔබ මෙහි නැවතී මා සමඟ අවදි ව ඉන්න.

1. උන් වහන්සේ මඳක් ඉදිරියට ගොස් මුණින් වැටී, මෙසේ යාච්ඤා කළ සේක.

✠ අහෝ මාගේ පියාණෙනි, හැකි නම් මේ කුසලාන මා කෙරෙන් පහ කළ මැනව. එහෙත්, මා කැමති ලෙස නොව, ඔබ කැමති ලෙස වේ වා.

1. උන් වහන්සේ ශ්‍රාවකයන් වෙත අවුත් ඔවුන් නිදා හිඳිනු දැක, පේදුරුට කතා කොට මෙසේ වදාළ සේක.

✠ සැබැවින් ම මා සමඟ එක පැයක්වත් අවදිව ඉන්න ඔබට බැරිවුණා ද? ඔබ පරීක්ෂාවට නොවැටෙන පිණිස අවදි ව සිට යාච්ඤා කරන්න. හිත නම් කැමති ය: ගත නම් දුබල ය.

1. උන් වහන්සේ නැවත දෙ වන වරටත් නික්ම ගොස් මෙසේ යාච්ඤා කළ සේක.

✠ අහෝ මාගේ පියාණෙනි, මා විසින් පානය නොකොට මේ කුසලාන පහ කළ නොහැකි නම්, ඔබගේ කැමැත්ත වේ වා.

1. උන් වහන්සේ නැවත ආ කල ඔවුන් නිදා හිඳිනු දුටු සේක. ඔවුන්ගේ ඇස් නිදිබර ව තිබිණි. යළිත් උන් වහන්සේ ඔවුන් හැර ගොස්, තුන් වන වරත් එම වචන කියා යාච්ඤා කළ සේක. ඉන්පසු උන් වහන්සේ තම ශ්‍රාවකයන් වෙතට අවුත්, මෙසේ වදාළ සේක.

✠ ඔබ තවමත් නිදාගෙන විඩා හරිමින් සිටින්නහු ද? මෙන්න, නියමිත මොහොත ළං වී ඇත: මනුෂ්‍ය-පුත්‍රයාණෝ පව්ටුන් අතට පාවා දෙනු ලබන සේක. නැඟිටින්න, අපි යමු. අන්න, මා පාවා දෙන්නා ඉතා ළඟ ය.

1. උන් වහන්සේ කතා කරද්දී, දොළොස් දෙනාගෙන් කෙනෙකු වන ජූදස් ද ඔහු සමඟ නායක පූජකයන් හා ප්‍රජා මූලිකයන් වෙතින් යවන ලද කඩු මුගුරු ගත් මහත් ජනකායක් ද එහි පැමිණියහ. උන් වහන්සේ පාවා දෙන්නා, "මම යමෙකු සිඹිම් ද, ඔබ සොයන තැනැත්තා ඔහු ය: ඔහු අල්ලාගන්න" කියා ඔවුන්ට ලකුණක් දී තිබිණි. එකෙණෙහි ම ඔහු ජේසුස් වහන්සේ වෙතට අවුත් මෙසේ කියමින් උන් වහන්සේ සිප වැළඳ ගත්තේය.

2. ගුරුදේවයෙනි, ඔබට සෙත් වේ!

1. ජේසුස් වහන්සේ ද ඔහු අමතා මෙසේ වදාළ සේක.

✠ මිත්‍රය, ඔබ කරන්න ආ දෙය කරන්න.

1. එවිට ඔව්හු අවුත්, ජේසුස් වහන්සේ අත්අඩංගුවට ගෙන, තදින් අල්ලාගත්හ. උන් වහන්සේ හා සමඟ සිටි අයගෙන් කෙනෙක්, අතින් කඩුව ගෙන නායක පූජකයාගේ දාසයාට ගසා ඔහුගේ කන කපා දැමී ය. එවිට ජේසුස් වහන්සේ කතා කොට මෙසේ වදාළ සේක.

✠ ඔබගේ කඩුව කොපුවේ දමන්න, කඩු ගන්නා සියල්ලෝ ම කඩුවෙන් ම නසිති. දේව දූතයන් සේනාංක දොළොසකට වඩා වහා ම එවන ලෙස මාගේ පියාණන්ගෙන් ඉල්ලන්න මට නොහැකි ය යි ඔබ සිතන්නෙහි ද? එහෙත්, එසේ කළොත්, මේ දෙය මෙලෙස ම විය යුතු යයි ශුද්ධ ලියවිලිවල කියන දේ ඉටු වන්නේ කෙසේ ද?

1. ඒ පැයේ දී ම ජේසුස් වහන්සේ ජනකායට කතා කොට මෙසේ වදාළ සේක.

✠ ඔබ සොරෙකුට විරුද්ධ ව මෙන් කඩු මුගුරු ගෙන මා අල්ලන්නට ආවහු ද? මම දිනපතා ම දේව මාළිගාවෙහි උගන්වමින් සිටියෙමි. එහෙත්, ඔබ මා අල්ලාගත්තේ නැත. මේ සියල්ල සිදුවූයේ දිවැසිවරයන්ගේ ලියවිලි ඉෂ්ට වන පිණිස ය. .

1. එවිට ශ්‍රාවකයෝ සියල්ලෝ ම උන් වහන්සේ අත්හැර පලා ගියහ. ජේසුස් වහන්සේ අල්ලාගත් අය උත්තම පූජක කයාපස් වෙතට උන් වහන්සේ ගෙන ගියහ. විනයධරයෝ ද ප්‍රජා මූලිකයෝ ද එහි රැස් වී සිටියහ. එහෙත් පේදුරු, උත්තම පූජකයාගේ මළුව දක්වා උන් වහන්සේ පසුපස්සේ දුරින් ගොස්, එහි ඇතුළු වී, කුමකින් කුමක් වේ දැ යි බලන පිණිස මුර සේවකයන් හා සමඟ හිඳ ගත්තේය.

නායක පූජකවරු ද මුළු ශ්‍රේෂ්ඨාධිකරණය ද ජේසුස් වහන්සේ මරණයට පත් කරන පිණිස උන් වහන්සේට විරුද්ධ ව බොරු සාක්ෂි සෙවූ හ. බොහෝ බොරු සාක්ෂිකාරයන් ඉදිරිපත් වූ නමුත්, කිසි සාක්ෂියක් සම්බ නො වී ය. පසුව දෙදෙනෙක් ඉදිරිපත් වී මෙසේ පැවසූහ.

2. දේව මාළිගාව කඩාදමා එය තුන් දිනකින් යළි ගොඩනගන්න මට පුළුවන් කියා මොහු කීවේ ය.

1. එවිට උත්තම පූජකයා නැඟිට ජේසුස් වහන්සේගෙන් මෙසේ ඇසුවේ ය.

2. ඔබ කිසි උත්තරයක් දෙන්නේ නැද් ද? මොවුන් ඔබට විරුද්ධ ව ගෙනෙන මේ සාක්ෂිය කුමක් ද?

1. එහෙත්, උන් වහන්සේ නිශ්ශබ්ද ව සිටි සේක. එවිට උත්තම පූජකයා උන් වහන්සේට කථා කොට මෙසේ කීවේය.

2. ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍ර වන ක්‍රිස්තුවරයාණෝ දැ යි දිවුරා අපට කියන ලෙස ජීවමාන දෙවියන් වහන්සේගේ නාමයෙන් ඔබට අණ කරමි.

1. ජේසුස් වහන්සේ ද උත්තර දෙමින් මෙසේ වදාළ සේක.

✠ ඔබ කියන දෙය හරි ය. තවදුරටත් මම ඔබට කියමි, මෙතැන් පටන් මනුෂ්‍ය-පුත්‍රයාණන් පරාක්‍රමයාණන්ගේ දකුණු පස වැඩ සිටිනවාත් අහසෙ වලාකුළු මත වඩිනවාත් ඔබ දකින්නෙහි ය.

1. එවිට උත්තම පූජකයා සන්තාපයෙන් යුතු ව තමාගේ වස්ත්‍ර ඉරාගෙන මෙසේ පැවසීය.

2. මොහු දේවාපහාසයක් කෙළේ ය. තවත් අපට සාක්ෂිකාරයන්ගෙන් වැඩක් නැත, මොහුගේ දේවාපහාසය දැන් ඔබට ඇසුණේ ය. ඔබ කුමක් සිතන්නහු ද?

1. ඔව්හු උත්තර දෙමින් මෙසේ පැවසූහ.

2. මොහු මරණයට සුදුසු ය.

1. එවිට ඔව්හු උන් වහන්සේගේ මුහුණට කෙළ ගසා, මිට මොලවා පහර දුන්හ. සමහරෙක් උන් වහන්සේට අතුල් පහර දී, මෙසේ කීහ.

2. ක්‍රිස්තුවරයාණනි, ඔබට ගැසුවේ කවරෙක් දැ යි දිවැසින් බලා අපට කියන්න

1. පේදුරු මළුවෙහි පිටත වාඩි වී සිටියේ ය. සේවිකාවක් ඔහු වෙත අවුත් මෙසේ කීවා ය.

2. ඔබත් ඒ ජේසුස් නම් ගලීලයා සමඟ සිටියෙහි ය.

1. එවිට පේදුරු සියල්ලන් ඉදිරියෙහි මෙසේ කී ය.

2. මොන බොරු ද? ඔය කතාව මට තේරෙන්නේ නැත.

1. දොරටුව කරා යන විට තව සේවිකාවක් ඔහු දැක, එහි සිටියවුන්ට මෙසේ කීවාය.

2. මොහුත් නාසරෙත්හි ජේසුස් සමඟ සිටියේ ය.

1. පේදුරු යළිත් මෙසේ දිවුරා කීවේ ය.

2. මා ඒ මනුෂ්‍යයා අඳුනන්නේ නැත.

1. මඳ වේලාවකට පසු එතැන සිටි අය අවුත් මෙසේ පේදුරුට කී හ.

2. සැබැවින් ම ඔබත් ඔවුන්ගෙන් එක් කෙනෙක් ය: ඒ බව ඔබගේ කතා ලීලාවෙන් පෙනේ.

1. එවිට පේදුරු මෙසේ කියමින් දෙස් තබාගන්න ද දිවුරන්න ද පටන් ගත්තේ ය.

2. ඒ මිනිසා නාඳුනමි.

1. එකෙණෙහිම කුකුළා හැඬලී ය. "කුකුළා හඬලන්න පළමු ඔබ මා හඳුනන්නේ නැත කියා තුන් වරක් කියනු ඇතැ"යි ජේසුස් වහන්සේ වදාළ වචන සිහි කොට පේදුරු පිටතට ගොස් ඉකිබිඳිමින් හැඬී ය.

පහන් වූ කල සියලු නායක පූජකවරු ද ප්‍රජා මූලිකයෝ ද ජේසුස් වහන්සේ මරණයට පත් කරන පිණිස උන් වහන්සේට විරුද්ධ ව කුමන්ත්‍රණය කළහ. ඔව්හු උන් වහන්සේට විලංගු ලා ගෙන ගොස් ආණ්ඩුකාර පිලාත්ට භාරදුන් හ.

උන් වහන්සේ පාවා දුන් ජුදස්, උන් වහන්සේ වරදට පත් කරනු ලැබූ බව දැක, ශෝකයෙන් පෙළී, රිදී මිල තිහ නායක පූජකවරුන් ද ප්‍රජා මූලිකයන් ද වෙත ආපසු ගෙනගොස් මෙසේ කීවේ ය.

2. නිදොස් කෙනෙකු මරණයට පාවා දීමෙන් මම පව් කෙළෙමි.

1. එහෙත් ඔව්හු මෙසේ කී හ.

2. එයින් අපට කමක් නැත, ඔබම එය බලාගන්න.

1. එවිට ඔහු ඒ රිදී මිල ශුද්ධස්ථානයෙහි විසිකොට දමා නික්ම ගොස් එල්ලී මළේ ය. නායක පූජකවරු ඒ රිදී මිල ගෙන මෙසේ පැවසූහ.

2. මේවා ලේ මිල බැවින් දේව මාළිගාවේ මුදල් ගබඩාවට දැමීම යුතු නැත.

1. එසේ කියා ඔව්හු මන්ත්‍රණය කොට, විජාතින් සඳහා සුසාන භූමියක් වන පිණිස ඒ මුදලින් 'කුඹල් කෙත' මිල දී ගත්හ. එහෙයින් අද දක්වා ඒ කෙතට 'ලේ කෙත' යයි කියනු ලැබේ. මෙසේ දිවැසිවර ජෙරමියාගේ කීමත් සැබෑ විය. එනම් "යම් කිසි කෙනෙකුගේ වටිනාකමේ හැටියට ඉශ්රායෙල් ජනතාව අතර සම්මත ව තිබූ මිලය වන රිදී මිල තිහ, සමිඳාණන් වහන්සේ මට අණ දුන් පරිදි, කුඹල් කෙත සඳහා දුනිමි යනුයි.")

1. ජේසුස් වහන්සේ ආණ්ඩුකාරයා ඉදිරියෙහි පෙනී සිටි සේක. ඔහු උන් වහන්සේගෙන් ප්‍රශ්න කෙළේ ය.

2. ඔබ ජුදෙව්වන්ගේ රජ ද?

1. ජේසුස් වහන්සේ මෙසේ උත්තර දුන් සේක.

✠ එසේ කියන්නේ ඔබය.

1. නායක පූජකවරුන් ද ප්‍රජා මූලිකයන් ද උන් වහන්සේට වරද තැබූ විට උන් වහන්සේ කිසි උත්තරයක් නුදුන් සේක. එවිට පිලාත් මෙසේ ඇසී ය.

2. මොවුන් ඔබට විරුද්ධව නගන චෝදනා ඇසෙන්නේ නැද්ද?

1. එහෙත් ජේසුස් වහන්සේ එක් වචනයකින් පමන වත් උත්තර නුදුන් සේක. එබැවින් ආණ්ඩුකාරයා අතිශයින් මවිත විය.

මංගල්‍යයේ දී ජනතාව ඉල්ලා සිටින සිරකරුවෙකු ආණ්ඩුකාරයා විසින් නිදහස් කර හරිනු ලැබීමේ සිරිතක් තිබිණි. එකල්හි ජේසුස් බරබ්බස් යයි නම් දැරූ ප්‍රසිද්ධ සිරකරුවෙක් විය. එහෙයින් සෙනග රැස්වූ විට, පිලාත් ඔවුන්ගෙන් මෙසේ ඇසී ය.

2. මා ඔබට කවරෙකු නිදහස් කර දෙනවාට ඔබ කැමති ද? බරබ්බාස් කියන ජේසුස් ද? නැතහොත් ක්‍රිස්තුස් කියන ජේසුස් ද?

1. එසේ ඇසුවේ, ඔවුන් ඊර්ෂ්‍යාවෙන් උන් වහන්සේ පාවා දුන් බව පිලාත් දැන සිටි හෙයිනි. තවද ඔහු විනිශ්චාසනයෙහි සිටිය දී ඔහුගේ භාර්යාව මෙසේ කියා යැව්වා ය.

2. ඒ නිදොස් මනුෂ්‍යයාට කිසිවක් නොකරන්න. ඊයේ රෑ ඔහු නිසා මම සිහිනයකින් බොහෝ දුක් වින්දෙමි

1. එහෙත්, නායක පූජකවරු ද ප්‍රජා මූලිකයෝ ද බරබ්බස්ව ඉල්ලන්නටත්, ජේසුස් වහන්සේ නසාලන්නටත් සෙනග කැමති කරවාගත්හ. ආණ්ඩුකාරයා ඔවුන්ට උත්තර දෙමින් ඔවුන්ගෙන් මෙසේ ඇසී ය.

2. මේ දෙදෙනාගෙන් කවරෙකු මා ඔබට නිදහස් කරදෙනවාට කැමති ද?

1. ඔව්හු මෙසේ කී හ.

2. බරබ්බස්

1. එවිට පිලාත් ඔවුන්ගෙන් මෙසේ ඇසී ය.

2. එසේ නම් ක්‍රිස්තුස් ය කියන ජේසුස්ට මා කුමක් කරන්න ද?

1. ඔව්හු සියල්ලෝම එක හඬින් මෙසේ කී හ.

2. ඔහු කුරුසියේ ඇණ ගසන්න.

1. එවිට පිලාත් මෙසේ ඇසී ය.

2. මන් ද? මොහු මොන අපරාධයක් කෙළේ ද?

1. එහෙත් ඔව්හු වැඩි වැඩියෙන් හඬ නගමින් මෙසේ මොරගැසූ හ.

2. ඔහු කුරුසියෙහි ඇණ ගසන්න.

1. මෙසේ කෝලහාලයක් හට ගනු මිස, තමාගේ ප්‍රයත්නයෙන් වැඩක් සිදු නොවන බව දුටු පිලාත්, වතුර ගෙන, ජනකාය ඉදිරියේ අත් සෝදමින් මෙසේ කී ය.

2. මේ මනුෂ්‍යයාගේ ලේ ගැන මම නිදොස් ය. ඔබ ම වගබලා ගන්න.

1. මුළු සමූහයා මෙසේ උත්තර දෙමින් කී හ.

2. ඔහුගේ ලේවල පල විපාකය අප පිට ද අපේ දරුවන් පිට ද වේ වා.

1. එකල පිලාත්, ඔවුන්ට බරබ්බාස් නිදහස් කර දුන්නේය. එහෙත්, ඔහු ජේසුස් වහන්සේට තළවා, කුරුසියෙහි ඇණ ගැසීමට භාර දුන්නේ ය. එකල ආණ්ඩුකාරයාගේ මුර සෙබළෝ ජේසුස් වහන්සේ ප්‍රෙතෝරියම් නම් රජ වාසලට ගෙන ගොස් මුළු සේනාංකය උන් වහන්සේ වෙතට රැස් කළහ. ඔව්හු උන් වහන්සේගේ ඇඳුම් ගලවාදමා නිල-රක්ත සළුවක් උන් වහන්සේට ඇන්දෙව්වෝය. තවද ඔව්හු කටු ඔටුන්නක් ගොතා උන් වහන්සේගේ හිස මත තබා, බට දණ්ඩක් දකුණතට දී උන් වහන්සේ අබිමුවෙහි දණ නමා, මෙසේ කියමින් උන් වහන්සේට සරදම් කළහ.

2. ජුදෙව්වන්ගේ රජුනි, සැරදේ!

1. ඔව්හු උන් වහන්සේට කෙළ ගසා, බට දණ්ඩ ගෙන, උන් වහන්සේගේ හිසට ගැසූ හ. මෙසේ ගැරහුම් කළ පසු ඔව්හු උන් වහන්සේට ඇන්දූ සළුව ගලවා, උන් වහන්සේගේ ම ඇඳුම් අඳවා, උන් වහන්සේ කුරුසියෙහි ඇණ ගසන පිණිස ගෙන ගියහ. ඔවුන් නික්ම යද්දී සීමොන් නම් කිරේනියේ මනුෂ්‍යයෙකු සම්භ වී, උන් වහන්සේගේ කුරුසිය උසුලාගෙන යන්න ඔව්හු ඔහුට බල කළ හ. ඔව්හු කපාල පිටය යන අර්ථ ඇති ‘ගොල්ගොතා’ නම් ස්ථානයට පැමිණ, තික්ත මිශ්‍ර මුද්‍රික පානය උන් වහන්සේට බොන්න දුන්හ.

උන් වහන්සේ එය දිව ගා බලා බොන්න අකමැති වූ සේක. උන් වහන්සේ කුරුසියෙහි ඇණ ගැසූ පසු, ඔව්හු උන් වහන්සේගේ ඇඳුම් දාදු දමා බෙදාගත්හ. ඔව්හු එහි හිඳ ගෙන උන් වහන්සේ මුර කළහ. තවද, "මොහු ජුදෙව්වරුන්ගේ රජ වන ජේසුස් ය" කියා උන් වහන්සේ පිළිබඳ චෝදනා පත්‍රය ලියා උන් වහන්සේගේ හිසට ඉහළින් තැබූ හ. එවිට සොරු දෙදෙනෙක්, එක් කෙනෙක් දකුණු පසෙහි ද එක් කෙනෙක් වම් පසෙහි ද උන් වහන්සේ හා සමග කුරුසියෙහි ඇණගසනු ලැබූහ. මඟ යන්නෝ තමන් හිස් වන වනා උන් වහන්සේට නින්දා කරමින්, මෙසේ කී හ.

2. දේව මාළිගාව කඩාදමා තුන් දවසකින් එය ගොඩ නගන ඔබ, ඔබ ම ගළවාගන්න: ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම්, කුරුසියෙන් බැස එන්න.

1. එම අයුරින් නායක පූජකවරු ද, විනයධරයන් හා ප්‍රජා මූලිකයන් සමග උන් වහන්සේට කවටකම් කොට මෙසේ කී හ.

2. මොහු අනුන් ගැළැව්වේ ය: දැන් තමාට ම ගැළවෙන්ට නුපුළුවන: මොහු ඉශ්රායෙල්වරුන්ගේ රජ නොවේ ද? එසේ නම් දැන් කුරුසියෙන් බසී වා, එවිට අපි මොහු විශ්වාස කරන්නෙමු. මොහු දෙවියන් වහන්සේ විශ්වාස කරගත්තේ ය: උන් වහන්සේ ඔහුට කැමති සෙක් නම් දැන් ඔහු මුදා හරින සේක් වා! මන්ද, 'මම දේවියන් වහන්සේගේ පුත්‍රයා වෙමි'යි මොහු කීවේ ය.

1. උන් වහන්සේ සමග කුරුසියෙහි ඇණ ගසනු ලැබූ සොරු ද එසේම උන් වහන්සේට නින්දා කළහ.

මද්දහනේ සිට අපරභාග තුන දක්වා රට පුරා තද අන්ධකාරයක් පහළ විය. තුනට පමණ ජේසුස් වහන්සේ මහහඬින් මෙසේ මොර ගැසූ හ.

✠ "ඒලි, ඒලි, ලාමා සබක්තානි"

1. එහි අර්ථය නම්

✠ මාගේ දෙවියනි, මාගේ දෙවියනි ඔබ මා අත්හැරියේ මක්නිසා ද?"

1. එහි සිටියවුන්ගෙන් සමහරෙක් ඒ අසා මෙසේ කී හ.

2. මොහු එලියා අමතන්නේ ය.

1. එකෙණෙහි ම ඔවුන්ගෙන් එක් කෙනෙකු දිව ගොස්, මුදු හත්තක්ගෙන ඇඹුල් මිදියුසවල පොඟවා බට දණ්ඩක ගසා, උන්වහන්සේට බොන්න දුන්නේ ය. සෙස්සෝ කතා කොට මෙසේ සැලකළෝය.

2. නිකම් ඉන්න, මොහු ගළවන්ට එලියා එන්නේ දැ යි බලමු.

1. ජේසුස් වහන්සේ යළිත් මහහඬින් හඬගා අවසන් හුස්ම හෙළූ සේක.

*(සියළුදෙන දණ ගසා මොහොතක් නිශ්චලව සිටින්න.)*

දේව මාළිගාවේ තිරය ඉහළ පටන් පහළ දක්වා දෙකඩව ඉරුණේ ය: පොළොව කම්පා විය: ගිරිකුළු දෙදරිණි: සොහොන් ගෙවල් විවර විය: දිවංගත ශුද්ධවරයෝ උත්ථාන කරනු ලැබූ හ. උන් වහන්සේගේ පුනරුජ්ජීවනයෙන් පසු, ඔව්හු සොහොන් ගෙවලින් නික්ම ශුද්ධ නුවරට ඇතුළු ව, බොහෝ දෙනෙකුට පෙනුණාහ. ශතාධිපතියා ද ඔහු සමඟ ජේසුස් වහන්සේ මුර කරමින් සිටි අය ද පොළෝකම්පාවත්, සිදු වූ දේත් දැක ඉතා බියපත් ව මෙසේ කීවෝය.

2. සැබැවින් ම මේ මනුෂ්‍යයා දෙවියන් වහන්සේගේ පුත්‍රයාය.

1. ගලීලයේ සිට උන් වහන්සේ කැටුව අවුත්, උන් වහන්සේට ආවතේව කළ බොහෝ කාන්තාවෝ ද එහි දුරින් සිට බලා සිටියහ. මග්දලායේ මරියා ද ජාකොබ්ගේ සහ ජෝසෙප්ගේ මව වූ මරියා ද සෙබදීගේ පුත්‍රයන්ගේ මව ද ඔවුන් අතර වූ හ.

සවස් වූ කල ජේසුස් වහන්සේගේ ගෝලයෙකුව සිටි ජෝශප් නමැති අරිමාතියේ ධනවතෙක් එහි පැමිණියේ ය. ඔහු පිලාත් ඉදිරියෙහි පෙනී සිට ජේසුස් වහන්සේගේ මළ සිරුර ඉල්ලුවේ ය. එවිට පිලාත් එය ඔහුට බාර දෙන්නට අණ කළේය. ජෝශප් මිනිය රැගෙන හණ රෙද්දකින් ඔතා තමන්ට පර්වතයෙහි කැණ තිබුණු අළුත් ම සොහොන් ගෙයි එය තැන්පත් කෙළේය. ඉන්පසු සොහොන් ගෙයි දොරකඩ මහා ගලක් පෙරළා තබා ගියේ ය. මග්දලාහි මරියා ද අනිත් මරියා ද එතැන සොහොන් ගෙය ඉදිරිපිට හිඳගෙන උන්නෝ ය.

පසුවදා එනම් සිකුරාදාට පසු දවසේ නායක පූජකවරුද පරිසිවරුද පිලාත්තු ඉදිරියේ රැස්වී මෙසේ කීවෝය.

2. ස්වාමීනි, ඒ වංචාකාරයා ජීවත්ව සිටිය දී මම තුන් දිනකට පසු මරණින් උත්ථාන වන්නෙමියි දෙඩූ බව අපට මතකය. එබැවින් තුන් වනදා දක්වාම ඔහුගේ සොහොන් ගෙය පරිස්සමෙන් රැකවල් කරන්නට අණ දුන මැනව. නැතහොත් ඔහුගේ ශ්‍රාවකයන් අවුත් ඔහු සොරා ගෙන ගොස් ඔහු මරණින් උත්ථාන වී යැයි සෙනඟට කියනවා ඇත. මෙයාකාරයෙන් පළමු ප්‍රයෝගයට වඩා අන්තිම ප්‍රයෝගය බලවත් වන්නේය.

1. පිලාත් උත්තර දෙමින් මෙසේ කීවේ ය.

2. ඔබට මුර කණ්ඩායමක් සිටී. ඔබ ගොස් ඔබට හැකි තරම් සොහොන සුරක්ෂිත කොට තබන්න.

1. ඔව්හු ගොස් ගල පිට මුද්‍රා තබා රැකවල් සිටුවා සොහොන් ගෙය සුරක්ෂිත කළෝය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*